
# ත්‍රස්ත විරෝධී නීති පිළිබඳව ඔබ දැනගත යුතු දේ



බියෙන්, සැකයෙන් සහ දේශපාලනිකව නිර්මාණය කරන ලද රාජ්‍ය ත්‍රස්තවාදයෙන් තොර ශ්‍රී ලංකාවක් සඳහා ඔබ සහාය දෙනවාද?

ත්‍රස්ත විරෝධී පනතෙහි විනාශකාරී ඉතිහාසය දැනගෙන, ඔබ සියලු ත්‍රස්ත විරෝධී නීති අවසන් කරන ලෙස ඉල්ලා සිටින පුරවැසියන්ගේ ඉල්ලීමට සවන් දෙනවාද?

ඔබ සැබෑ "ක්‍රම වෙනසක්" වෙනුවෙන් පෙනී සිටින්නේද?

අපගේ ඉතිහාසය සලකා බැලීමේ දී, බොහෝ විට දේශපාලන බලපෑමට ලක්වන පොලිසිය සහ හමුදාව වෙත ඔබ පුළුල් බලතල ලබා දෙනවාද?

# ත්‍රස්ත විරෝධී නීති මගින් අත්තනෝමතික බලතල ලබා දෙයි

'වැරදි' පිළිබඳ නොපැහැදිලි අර්ථකථනයන් ජනතාවගේ නිදහස සීමා කරයි. පොතක් ලිවීම, පත්‍රිකා බෙදා හැරීම, සමාජ මාධ්‍ය පළකිරීම් බෙදා ගැනීම, පෙළපාලි යාම, පොදු ස්ථානවල රැස්වීම, කථා පැවැත්වීම සහ සංවිධාන පවත්වාගෙන යාම වැනි ක්‍රියාකාරකම් පවා ත්‍රස්ත ක්‍රියා ලෙස සලකනු ලැබිය හැකි ය.

පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට හේතු හෝ බලය අයුතු ලෙස භාවිතා කිරීම විනිසුරුවරයෙකු විසින් පරීක්ෂා නොකරනු ලබන බැවින් අත්අඩංගුවට පත්වන පුද්ගලයාගේ ඉරණම සම්පූර්ණයෙන් ම පොලිසිය අතෙහි ඇත.

දේශපාලන හේතූන් මත අත්අඩංගුවට ගැනීමට සහ සිවිල් නිදහස සීමා කිරීමට ත්‍රස්ත විරෝධී නීති මගින් අවසර දෙයි. මෙමගින් විරුද්ධත්වයන් නිහඬ කිරීම, විරෝධයන් අපකීර්තියට පත් කිරීම සහ සුළුතර කණ්ඩායම්වලට දඬුවම් කිරීම සඳහා නීතිය භාවිතා කිරීමට දේශපාලනඥයින්ට හැකියාව ලබා දෙයි.

ත්‍රස්ත විරෝධී නීති මගින් ප්‍රජාතන්ත්‍රවාදය බාදනය කරන අතර, වින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට දීර්ඝ කාලීන පීඩාවන් ඇති කරයි. එය බිය සහ සැකය අවුළුවමින්, ප්‍රජාවන් අතර බෙදීම් ඇති කරයි.

# ජාතික ජන බලවේගය මෙසේ පොරොන්දු විය

## "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම"

"ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු සියලු පීඩාකාරී නීති අහෝසි කර, රටේ සියලු ම ප්‍රදේශවල ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් සහතික කරන" බවට ජාතික ජන බලවේගය පොරොන්දු විය.

(පි. 129)

## "විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම"


## රාජ්‍ය සේවයේ "වගවීම සහ විනිවිදභාවය සහතික කිරීම"

## "ජාතික ආරක්ෂාව පිළිබඳ වගවීම සහ වගකීම"

* "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්"
ජාතික ජන බලවේගය ප්‍රතිපත්ති ප්‍රකාශනය, 2024

# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

- ✗ "ත්‍රස්තවාදය" යනුවෙන් ලේබල් කරන ලද පුළුල් සහ නොපැහැදිලි වැරදි තවදුරටත් නොතිබිය යුතු ය.
- ✗ පුළුල් සහ නොපැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති ත්‍රස්තවාදය සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට පොලිසියට තවදුරටත් බලතල නොතිබිය යුතු ය.
- ✗ පරිපාලන රඳවා තබා ගැනීම් තවදුරටත් නොතිබිය යුතු ය.
- ✗ විධායක ජනාධිපතිවරයාට, ආරක්ෂක අමාත්‍යවරයාට, පොලිසියට හෝ හමුදාවට පුද්ගලයන්ගේ නිදහස සීමා කළ හැකි පුළුල් හා නොපැහැදිලි බලතල තවදුරටත් නොතිබිය යුතු ය.
- ✗ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි ලැයිස්තුගත කර ඇති, දුර්වල සහ බෙලහීන ආරක්ෂණයන් සහිත මෙම පුළුල් හා නොපැහැදිලි වැරදි සහ බලතල එලෙසින් ම රඳවා තබ ගන්නා නව නීති සම්පාදනය නොකළ යුතු ය.




## ශ්‍රී ලංකාව සතුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නොමැතිව ශක්තිමත් ත්‍රස්ත විරෝධී නීති රාමුවක් ඇත.

### ශක්තිමත් නීතිමය රාමුවක්:

1. දණ්ඩ නීති සංග්‍රහය රාජ්‍යයට එරෙහි වැරදි දහතුනකින් (13) රාජ්‍යය ආරක්ෂා කරයි.
2. ත්‍රස්තවාදය විශේෂ කර ගත් නීති අවම වශයෙන් දහයක් (10) පමණ තිබේ.
3. ජාතික ආරක්ෂාවට සම්බන්ධ තවත් නීති අවම වශයෙන් පහළොවක් (15) පමණ තිබේ.
4. පුද්ගලයන් හෝ සංවිධාන තහනම් කිරීමට රජයට දැනටත් බලය තිබේ.

### ශක්තිමත් ආයතනික රාමුවක්:

1. ජාතික බුද්ධි සේවය
2. ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය
3. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ඒකකය

### සර්වබලධාරී මහජන හදිසි නීතියක්:

1948 මහජන ආරක්ෂක ආඥා පනත ප්‍රකාරව ජනාධිපතිවරයාට පහත සඳහන් දෑ ප්‍රකාශයට පත් කළ හැකි ය:
හදිසි තත්ත්වයක්, අත්‍යවශ්‍ය සේවා, ඇඳිරි නීතිය සහ හමුදාව කැඳවීම.

හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඇති කාලවලදී ජනාධිපතිවරයාට:
පාර්ලිමේන්තු අධීක්ෂණයට යටත්ව වැරදි, අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් ආදිය සම්බන්ධයෙන් පුළුල් නීති සම්පාදනය කළ හැකි ය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇති බලතල අධික ය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වසර හතළිහකට (40) අධික කාලයක් පුරා අනිසි ලෙස භාවිතා කර ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට පත්වන රැඳවියන්ට මැකිය නොහැකි සමාජ අපකීර්තියක් ඇති වෙයි.

සංහිඳියාව සහ ආයතනික වෙනසක් ඇති කිරීමේ පියවරක් ලෙස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්පූර්ණයෙන් ම අහෝසි කළ යුතු අතර, නව ත්‍රස්ත නීති හඳුන්වා දීම සිදු නොකළ යුතු වේ.

පොලීසියට, හමුදාවට සහ විධායක ජනාධිපතිවරයාට අසීමිත බලයක් ලබා දෙන ත්‍රස්ත විරෝධී නීතිවලට

# සහයෝගය නොදක්වන්න

දණ්ඩ මුක්තිය, දූෂණය හෝ විධායක බලතල අත්තනෝමතික ලෙස භාවිතා කිරීමක් නොමැති ශ්‍රී ලංකාවක් සඳහා ජනතාව තුළ ඇති අධිෂ්ඨානයට

# සහයෝගය දෙන්න

නීතිය හා සමාජ භාරය
www.lst.lk

ක්ෂණික ඇමතුම් අංක
+94 11 2684845 | +94 11 2691228 | +94 11 2684853

ෆැක්ස් - +94 11 2686843

ඊමේල් - info@lst.lk

ලිපිනය – 102/3, බාන්ස් පෙදෙස, කොළඹ 07